ස/අධි/15/06 ප්‍ර.සං. ගො

2013.10.07

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

සමෘද්ධි සහකාර කොමසාරිස් / දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ,

දිස්ත්‍රික් සම්බන්ධිකරන නිළධාරි,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

........................................

**<u>කුඩා කණ්ඩායම් ප්‍රතිසංවිධානය හා ප්‍රජා මූල සංවිධාන ගොඩනැංවීම.</u>**

සමෘද්ධි වැඩසටහන ආරම්භයේ සිට කුඩා කණ්ඩායම් පදනම් කරගත් සංවර්ධන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක විය. දිවිනැගුම දෙපාර්තමේන්තුව පිහිටුවීමේ හා ඊට අදාල 2013 අංක 01 දරන දිවිනැගුම පනත තුලත් ප්‍රජා මූල සංවිධාන ගොඩනැංවීම පිළිබඳව විශාල වැදගත් කමක් ලබා දී ඇත. ඒ අනුව සමෘද්ධි බැංකු සහ මහ සංගම් වැඩපිළිවෙලට සම්බන්ද සියලුම කුඩා කණ්ඩායම් සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් කඩිනමින් දියත් කල යුතුව ඇත. පහත සඳහන් මගපෙන්වීම් ද උපයෝගි කර ගනිමින් 2013.10.15 දින සිට 2013.12.15 කාල සීමාව තුල දිස්ත්‍රික්කයේ සියලුම කුඩා කණ්ඩායම් සාමාජිකයින් දැනුවත් කිරීමේ වැඩපිළිවෙලක් සංවිධානය කල යුතුවේ.

සාකච්ඡාවට ලක්කල යුතු මාතෘකා

01. දිවිනැගුම දෙපාර්තමේන්තුව පිහිටුවීම හා එහි වැදගත්කම.
02. සාමූහික ක්‍රියාකාරකම් ( කණ්ඩායම් ක්‍රියාකාරකම් ) තුල ලැබිය හැකි වාසි සහගත තත්වයන් හා විශිෂ්ඨ කුඩා කණ්ඩායමක් තුල දැකිය හැකි ලක්ෂණ.
03. ග්‍රාමීය සංවර්ධනයේ දී ප්‍රජා මූල සංවිධාන වලට කල හැකි බලපෑම් හා ඉන් ලබාගත හැකි වාසි.
04. ජීවනෝපාය ව්‍යාපෘති, ණය වැඩසටහන්, ( දිවිනැගුම ඉසුර, රටවිරුවෝ ණය වැඩසටහන ගැන විශේෂයෙන් සඳහන් කල යුතුය) පිළිබඳව දැනුවත් කිරීම.

ඉහත මාතෘකා ද සලකා බලා එක් දින හෝ වරුවක වැඩසටහනක් ලෙස මහ සංගම් මට්ටමින් වැඩසටහන් කීපයක් ( සියලුම කණ්ඩායම් නියෝජනය වන ලෙස ) ගැලපෙන පරිදි සංවිධානය කිරීමට දිස්ත්‍රික්කයේ සියලුම මහ සංගම් , මූලස්ථාන, ව්‍යාපෘති හා බැංකු කළමණාකරුවන්ට උපදෙස් ලබාදිය යුතුය.

දිස්ත්‍රික්කයේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරිමට පෙර සියලුම සමෘද්ධි කළමණාකාරුවන් දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කිරිමේ වැඩසටහනක් සංවිධානය කිරිම උචිතය. කෙසේ නමුත් අදාල ප්‍රාදේශිය දැනුවත් කිරිම් හා පුහුණු කටයුතු සදහා දිස්ත්‍රික් පුහුණු කණ්ඩායමක් හදුනාගෙන ඔවුන් මගින් මෙම දැනුවත් කිරිම වඩාත් ඵලදායක වේ.

මෙම පුහුණු හා දැනුවත් කිරිමේ වැඩසටහන් සදහා ඔබ දිස්ත්‍රික්කයට රුපියල් මිලියන .............යොමු කරන අතර එම මුදල ඉක්මවු කිසිදු ප්‍රතිපාදනයක් ලබානොදෙනු ඇත. කෙසේ නමුත් වියදම් පියවා ගැනිමේ ඉතාම දුෂ්කර තත්වයකදි පමණක් වැඩසටහන හා ක්‍රියාත්මක කරන බැංකු සංගමයකින් / මහ සංගමයකින් එක් වැඩසටහනකට උපරිම රු. 3000/= ක මුදලක් වැයකල හැක. ලබාදි ඇති ප්‍රතිපාදන තුල වැඩසටහන ක්‍රියාත්මක කල යුතු අතර බැංකු සහ මහ සංගම් මගින් ප්‍රතිපාදන ලබාගැනිම ඉතාම අත්‍යාවශ්‍ය අවස්ථාවල පමණක් කල යුතුය.

දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය දැනුවත් කිරිම සදහා වන වියදම් ඇස්තමේන්තු දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, වෙත යොමුකර අනුමැතිය ලබාගත යුතුය.

මෙම ප්‍රතිපාදන නිළධාරින්ගේ සංයුක්ත දිමනා හෝ ගමන් වියදම් සදහා වෙන් නොකල යුතු අතර එම දිමනා උපදෙස් පරිදි බැංකු සහ මහ සංගම් මගින් ලබාගත හැක.

දිස්ත්‍රික්කයේ මෙම දැනුවත් කිරිමේ වැඩපිළිවෙල අධික්ෂණ කටයුතු සදහා සමෘද්ධි සහකාර කොමසාරිස් / දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ , දිස්ත්‍රික් සම්බන්ධිකරන නිළධාරින් විසින් කල යුතුය. සමෘද්ධි අධිකාරියේ නිළධාරින් ද එම කටයුතු සදහා යොමු කිරිමට දැනුවත් කිරිමේ වැඩසටහන් පිළිබදව පුර්ව දැනුම් දිමක් බැංකු හා මහ සංගම් අංශයට කල යුතුය.

ඉලක්ක ගත කාලය තුල අදාලදැනුවත් කිරිම් කර මේ සමග අමුණා ඇති ආකෘතිය පරිදි දිස්ත්‍රික්ක සාරාංශ වාර්තාවක් සමෘද්ධි අධිකාරියට යොමුකල යුතුය.

සි.ඩි. කළුආරච්චි,

සාමාන්‍යාධිකාරි / අධ්‍යක්ෂ ( බැංකු මුල්‍ය ) වැ.බ.

පිටපත - 01. ලේකම් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - කාරු. දැ.ගැ.ස.

02. අතිරේක ලේකම්, ග්‍රාමිය ආර්ථික - කාරු. දැ.ගැ.ස.

03. සමෘද්ධි අධිකාරියේ සියලුම අංශ ප්‍රධානීන් - කාරු. දැ.ගැ.ස. හා අ.ක.ස.

04. නියෝජ්‍ය අභ්‍යාන්තර විගණක, ශ්‍රි ලංකා සමෘද්ධි අධිකාරිය - කාරු. දැ.ගැ.ස. හා අ.ක.ස.